**සති අන්තයේ හා දීර්ඝ සති අන්තවලදී මහනුවර - කොළඹ මාර්ගයේ සුඛෝපභෝගී බස් රථ සඳහා ඇතිවන අධික මගී ඉල්ලුම සපුරාලීමට තාවකාලික පදනම යටතේ අතිරේක බස් රථ යෙදවීම සඳහා ලියාපදිංචි කර ගැනීම**

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් හානියට පත් මහනුවර-කොළඹ දුම්රිය මාර්ගය යථා තත්වයට පත් කරන තෙක් දුම්රිය මගින් ප්‍රවාහන පහසුකම් සලසා ගත් මගීන් වෙනුවෙන් බස් රථ සේවා සැපයීමට කැමති බස් රථ හිමියන් පහත කොන්දේසි යටතේ ලියාපදිංචි කර ගැනීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කර ඇත.

1) සති අන්ත/දීර්ඝ සති අන්ත/විශේෂ උත්සව කාල වලදී පමණක් මෙම සේවාව ක්‍රියාත්මක කරන අතර කොළඹ-මහනුවර දුම්රිය සේවාව යථාවත් වන තෙක් පමණක් මෙම විශේෂ බස් සේවාව ක්‍රියාත්මක කරනු ලැබේ.

2) බස් රථයේ ගමන්මාර්ගය වන්නේ කොළඹ සිට මීරිගම - කුරුණෑගල අධිවේගී මාර්ගය හරහා මහනුවර දක්වා වේ.

3) මගී සේවා අවසරපත්‍රයක් නොමැති ඉල්ලුම්කරුවන් සෑම මසකට වරක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අනුමත ගරාජයකින් ලබාගත් බස්රථයේ මූලික කාර්මික තත්ත්වය සම්බන්ධ තත්ත්ව වාර්තාවක් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය.

4) මගී සේවා අවසරපත්‍රයක් නොමැති ඉල්ලුම්කරුවන්ගේ බස්රථයට පූර්ණ රක්ෂණාවරණයක් තිබිය යුතු අතර එහි ගමන් ගන්නා මගීන් සඳහා අසීමිත රක්ෂණ ආවරණය ලබා තිබීම අනිවාර්ය වේ.

5) මෙම බස්රථ වල ආසනගත මගීන් පමණක් ප්‍රවාහනය කළ යුතුය.

6) මෙම බස් රථ සඳහා නිකුත් කරනු ලබන තාවකාලික අවසරපත්‍රය එහි සඳහන් කාල සීමාවට පමණක් වලංගු වේ.

7) මෙම බස් රථ මහනුවර-කොළඹ සේවාවෙහි ධාවනය වන සෑම අවස්ථාවකම තාවකාලික අවසරපත්‍රය බස් රථය තුළ තිබිය යුතුය.

8) සති අන්ත, දීර්ඝ සති අන්ත සහ විශේෂ උත්සව අවස්ථාවලදී පමණක් මෙම බස්රථ සේවාව ක්‍රියාත්මක වන බැවින් සහ අධිවේගී මාර්ගය හරහා ධාවනය වන බැවින් එක් අන්තයකට මගීන් නොමැතිව ධාවනය වීමට සිදුවීම යන කරුණු සලකා බලා මෙම බස්රථ සඳහා බස්රථයේ ආසන ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයකට ගමන් ගාස්තුව ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

9) අනුමත ගමන් දිශාව හැර ආපසු ගමනේදී මගීන් නංවා ගැනීම නොකළ යුතුය.

10) බස් රථයේ සේවයේ යොදවා ඇති රියදුරු, කොන්දොස්තර මහතුන් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ලියාපදිංචි වූ අය විය යුතු අතර, මූලික ලියාපදිංචිය සඳහා එය බාධාවක් නොවන අතර, ධාවනයේදී එය සපුරාලිය යුතුය.

11) ධාවනයේ යෙදෙන දිනය හා වේලාව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

12) බස්රථයේ අවම ආසන ගණන 45ක් විය යුතුය

13) බස්රථයේ පිරිවිතර ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අනුමත පිරිවිතර විය යුතුය.

14) මෙම තාවකාලික අවසරපත්‍රය පදනම්ව නිත්‍ය මගී සේවා අවසරපත්‍රයක් ඉල්ලුම් කිරීමට කිසිදු අයිතිවාසිකමක් හිමි නොවේ.

15) කොමිෂන් සභාව මගින් නියම කරනු ලබන ගාස්තු පමණක් මගීන්ගෙන් අය කල යුතු අතර, එම වටිනාකමට අදාල ප්‍රවේශ පත්‍රයක් නිකුත් කළ යුතු වේ. එම ප්‍රවේශ පත්‍රය ජාතික ගමනාගමන කොමිෂන් සභාව අනුමත ආකෘතියට අනුකූල විය යුතුය.

16) ඉහත දක්වා ඇති කොන්දේසි අනුව කාණ්ඩ 03ක් යටතේ සුඛෝපභෝගී සේවාවන් සඳහා තාවකාලික අයදුම් පත්‍ර කැඳවීමට තීරණය කර ඇත.

    i. දැනටමත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් වලංගු මගී සේවා අවසරපත්‍ර නිකුත් කර ඇති බස්රථ.

    ii. පළාත් ප්‍රවාහන අධිකාරි විසින් වලංගු මගී සේවා අවසරපත්‍ර නිකුත් කර ඇති බස්රථ.

    iii. ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් හෝ පළාත් ප්‍රවාහන අධිකාරී විසින් නිත්‍ය මගී සේවා අවසරපත්‍ර නිකුත් කර නොමැති බස්රථ.

17) අන්තර් පළාත් මගී ප්‍රවාහන සුඛෝපභෝගී අවසරපත්‍රයක් හිමි ධාවකයකු මෙම සේවාව සැපයීම සඳහා ඉදිරිපත් වන්නේ නම් එම ධාවකයන්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

18) පළාත් ප්‍රවාහන අධිකාරී වල සුඛෝපභෝගී මගී සේවා අවසර පත්‍රයක් හිමි ධාවකයන්ට පළාත් අධිකාරි නිර්දේශයන්ට යටත්ව දෙවන අවස්ථාව ලබා දෙනු ලැබේ.

19) ඉහත 17 සහ 18 යන අවස්ථා වලින් මෙම සේවාව සැපයීමට නොහැකි නම් මගී ප්‍රවාහන අවසරපත්‍රයක් නොමැති වුවද තම කැමැත්තෙන් මගී ප්‍රවාහන සේවාවක් සැපයීමට කැමති සුඛෝපභෝගී බස්රථ සඳහා සති අන්ත, දීර්ඝ සති අන්ත සහ විශේෂ උත්සව අවස්ථාවලදී පවතින මගී ඉල්ලුම අනුව හා නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව කොළඹ - නුවර මාර්ගයේ මගී ප්‍රවාහනය සඳහා තාවකාලික අවසරපත්‍ර යටතේ අවස්ථාව ලබා දෙනු ලැබේ.

ඉහත කොන්දේසි වලට යටත්ව තාවකාලික අවසරපත්‍ර නිකුත් කිරීම හෝ නොකිරීම සම්බන්ධ සියලු තීරණ ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතු වේ.

ඉහත කොන්දේසි යටතේ මෙම මගී ප්‍රවාහන සේවාව සැපයීමට කැමති බස් රථ හිමිකරුවන් කොමිෂන් සභාවේ ලියාපදිංචි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. මෙම ලියාපදිංචි කිරීමට අදාල ආකෘති පත්‍රය **www.ntc.gov.lk** වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026.03.26 පෙ.ව.10.00 ට පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ගෙනවිත් හෝ නො.241, උද්‍යාන පාර, කොළඹ 05 ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් ලැබීමට සැලැස්විය යුතුය.


**සභාපති**
**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**
**නො 241,**
**උද්‍යාන පාර,**
**කොළඹ 05**

**දුරකථන අංක : 0112 587372**
**ක්ෂණික ඇමතුම් :1955**